**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය - 2022**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ (“අධිකාරිය”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් / ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම , මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඌව, නුවරඑළිය සහ කළුතර ප්‍රාදේශීය කාර්යාලයන්හි ස්ථාවර තැන්පතු හා සත්දින තැන්පතු ආයෝජන වටිනාකම පිළිවෙලින් රු.3,550,000 ක්, රු.4,807,420 ක් සහ රු.1,616,380 කින් අඩුවෙන් සටහන් කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් වටිනාකම රු.9,973,800 කින් අඩුවී තිබුණි. | 2023 වර්ෂයට අදාළව කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ ස්ථාවර තැන්පතු ගිණුමට අදාළ නිවැරදි කිරීම් 2023 වර්ෂය තුළ කිරීමට කටයුතු කරන බවත් 2022 වර්ෂයේ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ ස්ථාවර තැන්පතුවට අදාළව බැංකු ශේෂ සනාථ කිරීමේ ලිපියේ සඳහන් වටිනාකම රු.34,080,938 වේ. එහෙත් අවසාන ගිණුම් තුළ පවතින වටිනාකම රු.29,273,517 කි. එබැවින් එම අගයන්හි වෙනස වන රු.4,807,420 මුදල ස්ථාවර තැන්පතු ගිණුම හර කර පොලී ආදායම් ගිණුම බැර විය යුතුය. මෙම නිවැරදි කිරීම 2023 වර්ෂයේ සිදු කරනු ඇත. | වර්ෂය අවසානයට බැංකු තැන්පතු හා ආයෝජන ශේෂයන් සඳහා ශේෂ සනාථන ලබාගෙන ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ගාල්ල, මාතර හා ඌව ප්‍රාදේශීය කාර්යාලයන්හි ස්ථාවර තැන්පතු හා සත්දින තැන්පතු පොලී ආදායම් පිළිවෙලින් රු.1,038,482 ක්, රු.149,079 ක් සහ රු.53,801 ක් අඩුවෙන්ද රත්නපුර සහ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයන්හි පොලී ආදායම පිළිවෙලින් රු. 697,933 ක් සහ රු.195,626 ක් වැඩියෙන්ද සටහන් කර තිබුණු බැවින් මුළු පොලී ආදායම රු.347,803 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ සත්දින කාලීන තැන්පතු සඳහා පොලී ආදායම ලෙස රු.1,523,747 ක මුදල 2022 වර්ෂයේ ගාල්ල ප්‍රදේශීය කාර්යාලයේ අවසාන ගිණුම් තුළ දක්වා ඇත. ලැබිය යුතු පොලී මුදල වන රු.1,038,482 ක් ගිණුම්ගත කර නොමැති අතර 2023 වර්ෂය තුළ අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන අතර මාතර ප්‍රාදේශීය කාර්යාලයේ අවසාන ගිණුම් තුළ පොලී ආදායම ලෙස වර්ෂය තුළ ලද සත්දින කාලීන තැන්පතු පොලී ආදායම රු.1,861,352 ක් හා ආයතනික සේවක ණය සඳහා ලද පොලිය රු.357,339 ක මුදල සමඟ එකතුව වන රු.2,218,692 ක මුදල දක්වා ඇත. එබැවින් රු.208,259 ක් වැඩිපුර දක්වා නොමැති අතර ලැබිය යුතු පොලී මුදල වන රු.149,080 ක් ගිණුම්ගත වී නොමැත. එම අගය සහ ඌව ප්‍රාදේශීය කාර්යාලයෙහි 2022 වර්ෂයට අදාළ රු.53,081 ක පොලී ආදායම 2023 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමේදී තැන්පතු සඳහා පොලී ආදායම් උපචිත පදනම අනුව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු පොලී ආදායම් රු.10,887,428 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ප්‍රාදේශීය කාර්යාල 03 ක ලැබියයුතු පොලී ආදායම රු.1,241,363 ක් අඩුවෙන්ද ප්‍රාදේශීය කාර්යාල 02 ක ලැබියයුතු පොලී ආදායම රු.5,400,547 ක් වැඩියෙන්ද සටහන් කර තිබුණු බැවින් මුළු ලැබියයුතු පොලී ආදායම රු.4,159,184 කින් වැඩි වී තිබුණි. | ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ සත්දින කාලීන තැන්පතු සඳහා ලැබිය යුතු පොලී මුදල වන රු.1,038,482 ක් හා මාතර ප්‍රාදේශීය කාර්යාලයේ අවසාන ගිණුම් තුළ ලැබිය යුතු පොලී මුදල වන රු.149,080 මුදල ගිණුම්ගත වී නොමැත. එම නිවරදි කිරීම්ද ඌව ප්‍රාදේශීය කාර්යාලයෙහි 2022 වර්ෂයට අදාළ රු.53,081 ක පොලී ආදායම හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාලට අදාළ පොලී වටිනාකම ලෙස වැඩියෙන් දක්වා ඇති රු.397,500 ක මුදලද 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන අතර 2022 වර්ෂයේ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ ස්ථාවර තැන්පතුවට අදාළ වෙනස වන රු. 4,807,420 ක් නිවැරදි කිරීම 2023 වර්ෂයේ සිදු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී තැන්පතු පොලී නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | විවිධ තොග | 17,406,500 | 14,091,696 | 3,314,804 | 2023 වර්ෂය වන විට විවිධ තොග ගිණුමේ ශේෂය හා භෞතික ශේෂය අතර වෙනසට හේතු හඳුනාගෙන එයට අදාළ ගැලපීම් ගිණුම් තුළ සිදු කළ බව දන්වමි. | වෙනසට හේතු සොයා ගැළපීම් සිදුකළ යුතුය. |
| (ආ) | ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය | | | | | |
| | කොම්පෝස්ට් තොගය | 134,025 | 394,965 | 260,940 | ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ කොම්පොස්ට් හා තවාන් 500 ව්‍යාපෘතියෙහි තොග වටිනාකම් ශේෂ පිරික්සුමේ දක්වා ඇති ප්‍රමාණය සමග | වෙනසට හේතු සොයා ගැළපීම් සිදුකළ යුතුය. |
| | තවාන් 500 ව්‍යාපෘති යෙහි තොගය | 401,998 | 2,278,166 | 1,876,168 | | |

| | | | |
|---|---|---|---|
| | | | උපලේඛන සැසඳීමට කටයුතු කළෙමි. ඒ අනුව ශේෂ පිරික්සුමේ ශේෂයන්ට ගැළපෙන අයුරින් උපලේඛනවල ශේෂයන් ද නිවැරදිව සකස් කර ඉදිරිපත් කර ඇත. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අධිකාරියේ වර්තමාන සාමාන්‍යාධිකාරී එම තනතුරට අදාළ බඳවා ගැනීමේ ලිපි ගොනුව සහ එම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අවස්ථා දෙකකදී පිළිවෙලින් 2023 ජනවාරි 10 හා මාර්තු 07 දින විගණනය සඳහා ඉල්ලීම් කළද 2023 මැයි 31 දින දක්වා අදාළ ලිපිගොනු ලබාදී නොතිබුණි. | වර්තමාන සාමාන්‍යාධිකාරී තනතුරට අදාළ බඳවා ගැනීමේ ලිපි ගොනුව සහ එම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව | අදාළ ගොනුව අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත අවශ්‍ය රාජකාරි කටයුතු සඳහා භාර දී ඇති බැවින් රජයේ විගණන අංශයට මෙතෙක් භාරදීමට නොහැකි වී ඇති අතර අදාළ කටයුතු අවසන් වූ වහාම ගොනුව විගණන අංශයට භාරදීමට කටයුතු කරනු ඇත. | අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPI/Admin/11/TSHDA/ආයතනික කටයුතු Vol.viii දරන 2023 මාර්තු 17 දිනැති ලිපියේ දැක්වෙන පරිදි එම ලිපිගොනු අමාත්‍යාංශයට ලබාදී නොමැති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 7 (1) වගන්තිය ප්‍රකාරව විගණනයට අවශ්‍ය තොරතුරු කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1998 වර්ෂයේ පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ පොහොර, දියර ඉසින යන්ත්‍ර හා තරාදි ලබා ගැනීම සඳහා කුඩා තේ වතු සමිතිවලට ලබා දී තිබුණු ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු ණය ශේෂය වූ රු.4,278,581 ක් වර්ෂ 24 ක් ගත වී තිබුණද අයකර ගැනීමට ඵලදායි පියවරක් නොගෙන ජංගම වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | මෙම මුදල් අයකර ගැනීමට ප්‍රාදේශිය කාර්යාල මගින් සමිති වෙත ලිඛිතව දැනුම්දීම් වාර ගණනාවකදී සිදු කර ඇති අතර සමිති නිලධාරීන් කාර්යාලයට කැඳවා අයවිය යුතු මුදල් පිළිබඳ දැනුවත් කර අයකර, තවදුරටත් අය නොවන ප්‍රමාණයන් සමථ මණ්ඩලය වෙත යොමු කර අයකර ගත හැකි ප්‍රමාණයන් රු.මිලියන 4.27 ක මුදල 1998 සිට මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් යටතේ ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වමින් ඉදිරියට පැමිණ ඇත.<br>වසර 24 ක සිට පවතින ශේෂයක් බැවින් අමාත්‍යාංශය මගින් රාජ්‍ය මුදල් | ණය ශේෂයන් අයකර ගතයුතුය. |

| | | |
|---|---|---|
| | දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය නොලැබීම මත අවසාන ගිණුම් තුළ තවදුරටත් ඉදිරිපත් කිරීමට සිදු වූ බව දන්වමි. තව ද පුරා වසර 24 පවත්වාගෙන යන මෙවැනි ගිණුම් පිළිබඳ විගණන හා කළමනාකරණ කමිටුව වෙත ද අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා මගින් ඉදිරිපත්කර ඇත. | |
| (ආ) 1998 වර්ෂයේ වර්ණ විභේදන යන්ත්‍ර ලබාදීමේ වැඩසටහන මඟින් පෞද්ගලික තේ කම්හල් හතරකට ලබාදී තිබුණු රු. 5,916,589 ක ණය මුදලක් 2022 වර්ෂය අවසාන වන තෙක් අයකර ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුනේද ඊරියගොල්ල කම්හලෙන් ලැබිය යුතු රු.2,436,449 ක් සඳහා පමණක් වන අතර කම්හල් දෙකක ගිවිසුමෙහි පවත්නා අඩුපාඩු හේතුවෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි. | වර්ණ විභේදන යන්ත්‍ර ලබා දුන් තේ කම්හල් 4 න් ඊරියගහ කම්හල පමණක් නෛතික ක්‍රියාමාර්ග යටතේ මුදල් අය කර ගැනීමට නඩු කටයුත්තක් සිදු වෙමින් පවතී. ගාල්ල විවිධ සේවා සමුපාකාර සමිතිය මගින් තේ කම්හල් කටයුතු නවතා ඇති නමුත් ඈවර කිරීමේ දී අධිකාරියට අය විය යුතු මුදල් නිදහස් කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙන බව දන්වා ඇත. අනෙක් කම්හල් 2 හි ගිවිසුම් හි පවත්නා අඩුපාඩු නිසා නෛතික ක්‍රියාමාර්ග ගත නොහැකි වී ඇත. නඩු කටයුත්තක් මගින් අයවන ප්‍රමාණය අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත. | පෞද්ගලික තේ කම්හල් වලින් මෙම මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර කඩිනමින් ගතයුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1998 වර්ෂයේදී කුඩා තේ වතු සංවර්ධන සමිති වෙත ලබාදී තිබුණු වාහන 23 ක් විකිණීමෙන් ලැබී තිබුණු රු. 9,155,483 ක මුදල හා පස සංරක්ෂණය වෙනුවෙන් 2020 වර්ෂයේ දී නුවරඑළිය හා රත්නපුර යන ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයන්හි ගොවීන්ට සහනාධාර දීමනාවක් ගෙවීමට ලබාදී තිබුණු මුදලින් ඉතිරි රු. 13,815,113 ක් වර්ෂ 2 සිට 24 දක්වා කාලයක් අධිකාරිය විසින් කිසිදු ඵලදායී කාර්යයක යෙදවීම හෝ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට හෝ කටයුතු නොකර “ගෙවිය යුතු” ලෙස ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කර තිබුණි | වාහන විකිණීමෙන් ලද මුදලින් මූල්‍ය කල්බදු ක්‍රමයට වාහන 03 ක් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇත. එම ඉල්ලීම ඉටු වුවහොත් වාහන විකිණීමෙන් ලද මුදල් භාණ්ඩාගාරයට ලබාදීම 2023 වර්ෂයේ දී සිදුවන අතර පාංශු සංරක්ෂණය සඳහා ගොවීන්ට ලබා දී තිබූ ගෙවීමට ඉදිරිපත් නොවීම මත ඉතිරි වූ ප්‍රමාණය ඉදිරියේ දී අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත කුඩා තේ වතු හිමියන් වෙත ගෙවිය යුතු නැවත වගා , පාළු සහනාධාර සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇත. | භාණ්ඩාගාරයෙන් ලද මුදල් අනුමත කාර්යයන්හි යෙදවීමට හෝ ආපසු යැවීමට ක්‍රියා කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.3 ඡේදය | නිත්‍ය තනතුරක් දරන්නකු රාජකාරී ඉටු කිරීමට පත්කළ හොත් ගෙවිය යුත්තේ ඔහු එම තනතුරට වැඩ බැලීමට පත්කරනු ලැබුවේ නම් ඔහුට ලැබෙන අතිරේක පාරිශ්‍රමිකයෙන් 2/3 ක් වුවත් ඊට පටහැනිව නිලධාරීන් තිදෙනෙකුට තනතුරු 03 ක රාජකාරී ඉටු කිරීමේ දීමනා වශයෙන් අදාළ තනතුරෙහි ආරම්භක වැටුපෙන් 1/4 ක දීමනාවක් ගෙවා තිබුණු බැවින්,වැඩිපුර ගෙවූ දීමනාව මාසිකව අයකර ගතයුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය ලබාදුන් තීරණය අනුව නිලධාරීන් දෙදෙනෙකුගෙන් පමණක් වැඩිපුර ගෙවූ මුදල් කොටස් වශයෙන් අය කරමින් පැවතුණද, සහකාර සාමාන්‍යාධිකාරී (සේවා) විසින් 2021 මාර්තු 08 දින සිට 2022 සැප්තැම්බර් 30 දක්වා මානව සම්පත් කළමනාකාර තනතුරේ රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබුණු රු.84,189 ක් ආපසු අයකරගෙන නොතිබුණි. | අදාළ නිලධාරියාට වැඩ බැලීමේ රාජකාරි කිරීමට හැකිද යන්න පිළිබඳව නිශ්චිත තහවුරුවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන ඒ අනුව ඉදිරිකටයුතු කිරීමට හා වැඩිපුර දීමනාවක් ගෙවවේ නම් එය අයකර ගැනීම සඳහා කටයුතු කරනු ඇත. | ආයතන සංග්‍රහයට අනුකූල නොවන ගෙවීම් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරියේ සාමාන්‍යාධිකාරීගේ අංක ආ/ 3/ 4/ IV (i) හා 2018 සැප්තැම්බර් 30 දිනැති උපකාර්යාල හා තේ පරීක්ෂක/ ව්‍යාප්ති කාර්යාල කුලී මුදල සම්බන්ධ උපදෙස් පත්‍රය | කලාප සංවර්ධන නිලධාරී කාර්යාල සඳහා ගෙවීම් කළ හැකි මාසික කුලිය රු.5,000 ක් වුවද 2022 වර්ෂය සඳහා දැරණියගල කලාප කාර්යාලය සඳහා මසකට රු.15,000 බැගින් කාර්යාල කුලී රු.180,000 ක් අධිකාරිය විසින් දැරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවීම් කර තිබුණි. මේ අනුව චක්‍රලේඛයට පටහැනිව රු.120,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | 2018 ලබා දී ඇති චක්‍රලේඛ උපදෙස් අනුව තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී කාර්යාලයක් සඳහා රු.3000 ක් ද කලාප තේ සංවර්ධන නිලධාරී කාර්යාලයක් සඳහා රු.5000 ක් ලෙස උපදෙස් ලබා දී ඇත. එහෙත් රාජ්‍ය ආයතන පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන කාර්යාල සඳහා එකී රාජ්‍ය | උපදෙස් පත්‍රය ප්‍රකාරව ගෙවීම් කළ යුතු අතර අවශ්‍ය වේ නම්, උපදෙස් පත්‍රයට සංශෝධනයන් සිදුකරවා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ආයතන මගින් අප වෙත දැනුම් දුන් මුදල ගෙවීමට කටයුතු කර ඇත. | |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2010 අප්‍රේල් 22 දිනැති DMS/E4/08/5/070/2 දරන කළමනාකරණ සේවා අංක 30 චක්‍රලේඛයෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ලිපියේ ඡේද අංක 02 හා ඇමුණුම. | අධිකාරියේ සහකාර සාමාන්‍යාධිකාරී (සේවා) තනතුර දැනට තනතුර දරන්නාට පමණක් පෞද්ගලික වන සේ අනුමත කර තිබුණු අතර, ඒ අනුව මෙම තනතුර සඳහා නව බඳවා ගැනීම් සිදු නොකළ යුතුව තිබියදී අධිකාරිය විසින් සහකාර සාමාන්‍යාධිකාරී (සේවා) තනතුර සඳහා අයදුම්පත් කැඳවා 2010 ජූලි 06 දින සම්මුඛ පරීක්ෂණය පවත්වා 2010 අගෝස්තු 02 දින නිලධාරියෙකු පත්කර තිබුණි. | අදාළ තනතුර පිහිටුවීම සඳහා ඉවහල් වී ඇති ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති නඩු තීන්දුවක් සහ එකී නඩු තීන්දුව පදනම්ව පුරප්පාඩු වූ තනතුරකට සිදුකර ඇති බඳවාගැනීමක් වන අතර පුරප්පාඩු වූ තනතුරක තනතුර දරන්නෙක් සිටිය නොහැකි බව සාමාන්‍ය පරිපාලන තත්ත්වය අනුව සලකා බැලූ විට තහවුරු වන කරුණක් වනු ඇත. | නිරීක්ෂණයට අදාළව පිළිතුරු ලබාදී නොමැත. මෙම පත්වීම් සිදු කළ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 283,198,552 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 171,795,953 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.454,994,505 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ සංවර්ධන ප්‍රදාන රු.1,214,480,354 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.46,100,051 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංවර්ධන කටයුතු සඳහා ලද රජයේ ප්‍රදාන සියයට 91කින් අඩුවී තිබුණු අතර, පුනරාවර්තන ප්‍රදාන සියයට 7 කින් වැඩි වී තිබුණි. එසේ වුවද සංවර්ධන වියදම සියයට 57කින් අඩුවී තිබුණු නමුත් මෙහෙයුම් වියදම් සියයට 12 කින් වැඩිවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අනෙකුත් ආදායම් සියයට 111 කින් වැඩිවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 1.4 : 1 ක් හා 1.07:1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාත පිළිවෙලින් 1.6 : 1 හා 1.3 : 1 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුදල් හා මුදල් සමාන දෑ සියයට 42 කින් අඩුවීම ජංගම හා ක්ෂණික වත්කම්හි අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| "යාන්ත්‍රික ශ්‍රමික පුහුණු වැඩසටහන"සඳහා වලවල් හැරීමේ යන්ත්‍ර 73ක් රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවෙන් සෘජුව මිලදී ගැනීම සඳහා එම සංස්ථාවෙන් ලබාගෙන තිබුණු මිල කියුමෙහි මාස එකක ලංසු කාලය අවසන් වීමෙන් පසු යන්ත්‍ර මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කමිටු තීරණය ලබාගෙන තිබීමෙන් අධිකාරියට එම මිල ගණන් වලට භාණ්ඩ මිලදී ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව යන්ත්‍රයක් සඳහා එකඟ වූ මිලට වඩා රු.23,008ක වැඩි මිලකට පෞද්ගලික සමාගමකින් එම යන්ත්‍ර මිලදීගැනීමට සිදුවී තිබීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.7.1 (ආ) ප්‍රකාරව කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.1,679,584ක මූල්‍යමය පාඩුවක් අධිකාරියට සිදුවී තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ විවිධ නීතිගත සංස්ථාව රජයේ භාණ්ඩ සැපයීම්වලට අදාළ ප්‍රමුඛ රාජ්‍ය ආයතනයක් වන බැවින් අදාළ උපකරණ එම ආයතනය සතුව පවතින්නේ ද යන්න පූර්ව වශයෙන් තහවුරු කරගැනීම, මිළ ඉදිරිපත් කිරීම තුළ එම භාණ්ඩය සැපයුම් කිරීමට අදාළ ආයතනයට හැකියාවක් ඇති බවට ආයතනයේ තහවුරුව ලෙස පිළිගන්නා කරුණක් වන අතර එම කරුණින් පරිබාහිරව පුද්ගලික ආයතනයකින් භාණ්ඩ ලබා ගැනීමේ දී ද අදාළ ආයතනයේ සැපයීම් කිරීමේ හැකියාවක් පවතීන්නේද යන්න පරීක්ෂා කර බැලීමේ වෙනත් ක්‍රමවේදයක් නොමැත. 2021 සැප්තැම්බර් 22 දිනැති ලිපිය මගින් වලවල් හැරීමේ යන්ත්‍ර ඇණවුමෙන් ඉතිරි ප්‍රමාණය සැපයීම සඳහා මාස 03 ක කාලයක් වැයවන බවත් රටේ ඩොලර් හිගය හා රටේ පැවැති ආර්ථික ප්‍රශ්ණ මත වලවල් හැරිමේ යන්ත්‍ර කිසිසේත්ම ඉදිරිපත් කර ඇති මිළගණන් යටතේ ලබා දීමට නොහැකි බවත් රජයේ වානිජ විවිධ නීතිගත සංස්ථාව දන්වා ඇත. එමෙන්ම තේ කප්පාදු යන්ත්‍ර ඉතිරි ප්‍රමාණය ලබා දීමට නොවැම්බර් 15 දක්වාද වලවල් හැරීමේ යන්ත්‍ර ලබා දීම සඳහා මාස 03 ක කාලයක්ද කල් ඉල්ලා ඇත. දෙසැම්බර් 22 දින වන විට රජයේ වානිජ විවිධ නීතිගත සංස්ථාව හෝ ඔහුගේ සැපයුම්කරු යම් ප්‍රමාදයක් සිදුකළ හොත් දින 07 ක් වැනි කෙටිකාලයක් තුළ මෙම උපාංග ඇණවුම සම්පූර්ණ කරගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි වේ. එබැවින් සියලු ප්‍රායෝගික කරුණු සලකා බලා අදාළ යන්ත්‍ර වෙළඳපොළ මිළ සැසඳුම් ක්‍රමය යටතේ ලබා ගැනීමට සුදුසු බවට සාමාන්‍යාධිකාරි විසින් 2021-10-27 දින පැවැති භාණ්ඩ මිළදී ගැනීමට අදාළව අධිකාරිය තුළ පැවැති රැස්වීමේ තීරණ ද සලකා උපදෙස් ලබා දීමක් පමණක් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව මිලදී ගැනීම් සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| | සිදුකර ඇති අතර වලවල් හැරීමේ යන්ත්‍ර 01 රු. 99,800/- බැගින් යන්ත්‍ර 73ක් මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත කටයුතු කර ඇත. | |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය විසින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සතු ඉඩමක රු.44,484,405 ක් වියදම් කර කැගල්ල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල ඉදිකර තිබුණු අතර කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පමණක් එකඟතාවය ලබාදෙන බවත් භූමියේ අයිතිය සඳහා හිමිකම් පෑමක් කළ නොහැකි බවත් , මේ පිළිබඳව අවබෝධතා ගිවිසුමකට එළඹිය යුතු බවත් රබර් සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් අධිකාරියේ සාමාන්‍යාධිකාරී වෙත 2022 අගෝස්තු 02 දින ලිඛිතව දැනුම්දී ඇතත් 2023 මාර්තු 01 දින වන විටත් එවැනි අවබෝධතා ගිවිසුමක් සකස්කර හෝ අත්සන් කර නොතිබුණි | අමාත්‍යාංශ ප්‍රතිපාදන මගින් සේවා පියසක් ඇති කිරීමේ අරමුණින් ගාල්ල සහ කැගල්ල දිස්ත්‍රික්කවල ඉදිකිරීම් ආරම්භ කරන ලදී. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත 1974 දී පවරා ගන්නා ලද වගා භූමිය 1978 දී ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත භාරදීමෙන් අනතුරුව මෙම ඉඩම් කොටස " කැළණිවැලි " වතු සමාගමට අයත් දේවාල කන්ද වත්තේ කොටසක්ව පැවතිණි. එකී වැවිලි සමාගම විසින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලියවිලි මගින් භාරදී ඇති අතර ඉන් පර්චස් 15 පමණ භූමි ප්‍රදේශයක් ඉහත සඳහන් "සේවා පියස" ඇති කිරීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ලිපියකින් ලබා දී ඇත. ඉහත කරුණු මත මෙම ඉඩමේ අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු බවත් පැවරුම් මඟින් අදාළ ආයතනය වෙත ලබා දී ඇති බවක් පෙන්නුම් කරනු ඇත. | මෙම ඉඩම අධිකාරිය වෙත පවරා ගැනීමට හෝ නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ආ) අධිකාරිය විසින් 2021 අගෝස්තු 09 දින පත්වීම් ලබා දී තිබුණු ප්‍රාදේශීය කළමනාකරු තනතුරු 4ක් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිවැරදිව ලකුණු ලබා දී නොතිබීම හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබීමට පෙර පත්වීම් ලබා දී තිබීම සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ විගණන වාර්තාවෙන්ද අනාවරණය කර තිබුණද ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් අධිකාරිය විසින් ගෙන නොතිබුණි. | විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් ලකුණු ලබාදුන් පසු එම සම්මුඛ පරීක්ෂණයේ තීරණ අභියෝග කිරීමේ ක්‍රමවේදයක් නොමැත. ප්‍රාදේශීය මට්ටමින් අධිකාරියේ සමස්ත ක්‍රියාවලිය මෙහෙයවනු ලබන්නේ ප්‍රාදේශීය කළමනාකරු බැවින් අදාළ තනතුරු පුරප්පාඩු ආයතනයේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා කඩිනමින් පිරවිය යුතු තනතුරු බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය හා අමාත්‍යාංශ ලේකම්ගේ ආවරණ අනුමැතියට යටත්ව අදාල තනතුරු ලබාදීම සිදුකර ඇත. එමෙන්ම එකී අනුමැතින් නිසිපරිදි ලැබී ඇති බැවින් අදාළ ක්‍රියාවලියේ දෝෂ සහගත තත්ත්වයක් තිබී නොමැත. | නුසුදුසු අයදුම්කරුවන්ට ලබා දුන් පත්වීම් අහෝසිකර සුදුසු අයදුම්කරුවන් එම තනතුරුවලට පත්කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි රු.මිලියන 250 ක මූල්‍ය ප්‍රතිපාදන මත 2020 නොවැම්බර් මස ආරම්භ කරන ලද "තේ පැළ මිලියන 25 විශේෂ ව්‍යාපෘතිය" යටතේ ප්‍රාදේශීය කාර්යාල මගින් 2020 හා 2021 වර්ෂයන්හි අවසරපත්‍ර නිකුත් කර ඇති තවාන්කරුවන් 254 දෙනෙකු විසින් තවාන් ගෘහයෙන් සියයට 75 ක වැඩ නිමකර නොතිබුණු බැවින් දෙවන වාරිකය නිකුත්කර නොතිබුණි. මෙම ප්‍රතිලාභීන්ට රු. 24,711,304 ක මූල්‍ය සහ මෙහෙයුම් ද්‍රව්‍ය ආධාර ලබා දී තිබුණද, 2022 දෙසැම්බර් 31 දින වන විටත් වගා කටයුතු ආරම්භ නොකළ තවාන් කරුවන්ට ලබාදුන් ආධාර ආපසු අයකර නොතිබීම, ව්‍යාපෘතියේ කාර්ය සාධනය සම්බන්ධයෙන් ප්‍රාදේශීය කාර්යාලවල තේ පරීක්ෂකවරුන් විසින් ක්ෂේත්‍රයෙන් අත්‍යාවශ්‍ය වාර්තා ලබා නොගැනීම හා රු.22,276,855 ක ව්‍යාපෘතියේ මුදල් හා උපකරණ සමාලෝචිත වර්ෂය අවසානයේදීත් බෙදාහැර නොතිබීම නිසා අධිකාරිය විසින් ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | පළමු වාරිකය ලබා දීමෙන් පසුව දෙවන වාරිකය නිදහස් කිරීම සඳහා තවාන් ගෘහය 75% ක් සකස් කර අවසන් කළයුතු වේ. එසේ නොමැති තවාන් සඳහා දෙවන වාරිකය නිකුත් කිරීම සිදු නොකරන ලදී. ඒ අනුව 75% තවාන් ගෘහය සකස්කර අවසන් කර නොමැති තවාන් 254 ක් සඳහා දෙවන වාරිකය ලබාදී නැත. මෙහිදී 2020 හා 2021 යන වර්ෂයන්හි පැවැති කොරෝනා වසංගත තත්ත්වයන් හමුවේ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු අඩාල වීම හේතුවෙන් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී නිර්දේශයන් ලබාදීම ප්‍රමාද වීම මෙයට හේතු වී ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 123 ක පදිංචිකරුවන් 795 දෙනෙකු ව්‍යවසායකයින් ලෙස නිර්මාණය කිරීම අරමුණ විය. ඉන් 634 දෙනෙකු ප්‍රස්තුථ කරුණු සම්පූර්ණ කර ඇත. ඒ සඳහා ගෙවූ නොගෙවූ මූල්‍යාධාර ලබාගත් අය වෙත එකී මුදල් නැවත ගෙවීමටත් එසේ නොමැති නම් නෛතිකව කටයුතු කිරීමට අධිකාරිය ක්‍රියාකර කර ඇත. මෙමගින් මූල්‍යමය පාඩුවක් සිදු නොවීමට වගකියනු ඇත. | ව්‍යාපෘතියේ කාර්යසාධනය ඉහළ නැංවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේදී ආරම්භ කර තිබුණු කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය මගින් ප්‍රාදේශීය කාර්යාල 08 වෙතින් මාසිකව මෙට්‍රික් ටොන් 05 ක් බැගින් මෙට්‍රික් ටොන් 40 ක නිෂ්පාදනයක් ඉලක්ක කර ගනිමින් කොම්පෝස්ට් අමුද්‍රව්‍ය කැබලි කිරීමේ යන්ත්‍ර 08 ක් ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙතින් සෘජු කොන්ත්‍රාත් ක්‍රමය භාවිතා කර රු.2,300,000 කට 2021 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද මෙම යන්ත්‍රවල අවශ්‍යතාවයට සරිලන ප්‍රමාණවත් ධාරිතාවයක් නොමැති වීම | කුඩා තේ වතු හිමියන් ලක්ෂ 5 ක් පමණ හා ජාතික තේ නිෂ්පාදනයෙන් 75% ක් දායක වන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පුහුණු මධ්‍යස්ථාන 8 කින් ගොවීන් පුහුණු කිරීම සඳහා රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාවෙන් සෘජු මිලදී ගැනීම් ක්‍රමවේදය යටතේ (කැබිනට් අනුමැති) මිලදී ගන්නා ලදී. ඒ අනුව ගොවීන් පුහුණු කිරීම ඉතාම සාර්ථකව සිදු කළ අතර නිෂ්පාදන විකිණීම හා නිෂ්පාදන ඉලක්කගත ප්‍රමාණයට සිදු කිරීමට නොහැකි විය. තවද 2022 වන විට නැවත රාජ්‍ය ප්‍රතිපත්තිය මත කාබනික පොහොර භාවිතා කළ අතර අප ගොඩනගන ලද නිෂ්පාදනයන් තවදුරටත් ආදායම් වර්ධනය කිරීම හා | මිලදීගත් යන්ත්‍ර යොදා ගෙන සැලසුම්ගත ආකාරයට මාසිකව මෙට්‍රික් ටොන් 40 බැගින් කොම්පෝස්ට් නිෂ්පාදනය කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | හේතුවෙන් මිලදීගත් දින සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මෙ.ටොන් 37 ක තොගයක් පමණක් නිෂ්පාදනය කර තිබුණු අතර 2023 වර්ෂයේදී කිසිදු නිෂ්පාදනයක් සිදුකර නොතිබුණි. | මුදල් ඉපයීම් පරමාර්ථයන් තුළ කටයුතු කරගෙන යනු ඇත. | |
| (ඇ) | රු. 2,801,891 ක් වටිනා කාර්යාල උපකරණ අයිතම 17ක් ප්‍රධාන කාර්යාලයට හා අනෙකුත් අංශ වෙත බෙදා දී තිබුණද එම වත්කම් අදාළ ගිණුම් වලට සටහන් නොකර විවිධ තොග ගිණුමේ ඇතුළත් කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් අවශ්‍ය ගැලපීම් කිරීම සඳහා විවිධ තොග ගිණුම නිවැරදි කරනු ඇත. | වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෑගල්ල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය සඳහා කුඩා තේ වතු සංවර්ධන පනතේ අධිකාරියේ කාර්ය හා බලතල ප්‍රකාරව කුඩා තේ වතු වලට, කර්මාන්තශාලාවලට තේ ඉඩම් සංවර්ධනයට හා යෙදී සිටින්නන්ගේ ශුභ සිද්ධිය සඳහා අවශ්‍ය සියලු පියවර අධිකාරිය විසින් ගත යුතු වුවද, එම කාර්යය සිදු කිරීම වෙනුවට අධිකාරියේ ලාංඡනය සහිත ලිපි ශීර්ෂ හා තනතුර භාවිතා කරමින් අධිකාරියේ නොවන ගිණුම් අංකයකට සමිති වෙතින් ඉල්ලීම් කර මුදල් රැස්කර තිබුණු අතර එම මුදල් වියදම් කළ ආකාරය පිළිබඳව ද විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 1975 අංක 35 දරන පනතට අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ කාර්ය හා බලතල ප්‍රකාරව කුඩා තේ වතු හිමියන්හට කර්මාන්ත ශාලා සහ තේ ඉඩම් සඳහා සමීප සේවාවක් සැපයීම සඳහා රජය විසින් විශාල මුදලක් වැයකර සකස් කරන ලද ගොඩනැගිල්ල ක්‍රියාකාරී ලෙස ජනතා අයිතියට පැවරියයුතු විය. සුභසාධක සංගමයේ නිල වශයෙන් සභාපති වන ප්‍රාදේශීය කළමනාකරු විසින් මෙම දැනුම්දීම සිදුකරන ලදී. එය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත මූල්‍ය ආධාර එකතු කිරීමක් නොවන බැවින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පනත උල්ලංඝනය කර නොමැත.<br>ඒ අනුව ක්‍රීඩා හා සුභසාධක සංගමයේ සභාපති නිල වශයෙන් ප්‍රාදේශීය කලමනාකරු වන බැවින් සහ කුඩා තේ වතු ප්‍රජාව හඳුන්වනු ලබන්නේ සුභසාධක සංගමයේ සභාපති නොව ප්‍රාදේශීය කළමනාකරු බැවින් එම තනතුර භාවිතා කර ප්‍රාදේශීය සංවිධානයේ ඉල්ලීම් තහවුරු කිරීම සඳහා අදාළ ලිපිය යවා ඇත. | පනතට පටහැනි කාර්යන් සිදු නොකළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.8.1 (ආ) හා (ඇ) ඡේදය ප්‍රකාරව විෂය පිළිබඳ විශේෂඥයකුගෙන්/ විශේෂඥයන්ගෙන් දැනුමක් ඇති අවම වශයෙන් එක් සාමාජිකයෙකුගෙන් හෝ තාක්ෂණික ඇගයීම් කමිටුව සමන්විත විය යුතු වුවත් " තේ වගා යාන්ත්‍රීකරණ පුහුණු වැඩ සටහන 2021" සඳහා වලවල් හැරීමේ යන්ත්‍ර 73ක් මිලදී ගැනීම සඳහා විශේෂඥ දැනුමක් සහිත එක් සාමාජිකයෙකු හෝ ඇගයීම් කමිටුවට පත් කර නොතිබුණි. | කැබිනට් මණ්ඩල තීරණය අනුව රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාවෙන් භාණ්ඩ මිළදී ගෙන ඇත. ඒ අනුව මිළගණන් කැඳවීමක් සිදුකර නොමැති අවස්ථාවක මාර්ගෝපදේශ සංග්‍රහයේ සියලු කරුණු එලෙසින්ම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය කුමක්ද යන්න සලකා බැලිය යුතුය. අධිකාරිය විසින් මෙම භාණ්ඩ 2019 වර්ෂයේ ද මිළදීගෙන ඇති බැවින් එහිදී භාවිතා කර ඇති පිරිවිතරයන් මෙම මිළදීගැනීම් සඳහාද භාවිතා කර ඇති අතර 2019 වර්ෂයේ මිළදී ගත් භාණ්ඩ 2021 වර්ෂය වන විටද එම යන්ත්‍ර ඉතාම හොඳ මට්ටමෙන් ක්‍රියාත්මකවීම පිළිබඳව සලකා බලා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිලධාරින්ට ඇති අත්දැකීම් මත ලබාගත් වඩා පිළීගත හැකි කරුණු මත නිර්දේශ ලබා දී ඇත. උපකරණ මිලදී ගැනීමේ දී උපකරණයේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් ඇතිවීම වලක්වාගෙන ඇති බව කාරුණිකව පෙන්වා දෙන අතර මාර්ගෝපදේශ සංග්‍රහයෙන් ආවරණය කර දී ඇති කරුණ ඉහත පරිදි වන වෙනත් ක්‍රමවේදයන් භාවිතා කොට සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය කිරිම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.4 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්තුවට සිදු කරන වෙනස්කිරීම් වැනි කටයුතු සලකා බැලීම පිණිස ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව නැවත කැඳවිය හැකි වුවද වලවල් හැරීමේ යන්ත්‍ර 73 රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාවට සම්පූර්ණ භාණ්ඩ ප්‍රමාණය සැපයිය නොහැකි බැවින් කාලය දීර්ඝ කර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබීම හේතුවෙන් ඒ සම්බන්ධ තීරණයක් ගැනීමට ප්‍රසම්පාදන කමිටුවට භාරදීම වෙනුවට සාමාන්‍යාධිකාරීගේ අනුමැතියෙන් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය භාවිතා කර පුද්ගලික ආයතනයකින් STIHL BT 230 වර්ගයේ වලවල් හැරීමේ යන්ත්‍ර 1ක් රු. 99,608 බැගින් යන්ත්‍ර 73 ක් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. | 2.4 ඡේදය කොන්ත්‍රාත්තුවට සිදු කරන වෙනස්කිරීම් වැනි කටයුතු සලකා බැලීම පිණිස ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව නැවත කැඳවිය හැකි වුවද වලවල් හැරීමේ යන්ත්‍ර 73 රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාවට සම්පූර්ණ භාණ්ඩ ප්‍රමාණය සැපයිය නොහැකි බැවින් කාලය දීර්ඝ කර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබීම හේතුවෙන් ඒ සම්බන්ධ තීරණයක් ගැනීමට ප්‍රසම්පාදන කමිටුවට භාරදීම වෙනුවට සාමාන්‍යාධිකාරීගේ අනුමැතියෙන් වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය භාවිතා කර පුද්ගලික ආයතනයකින් STIHL BT 230 වර්ගයේ වලවල් හැරීමේ යන්ත්‍ර 1ක් රු. 99,608 බැගින් යන්ත්‍ර 73 ක් මිලදී ගැනීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය කිරිම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 (ආ) වගන්තිය ප්‍රකාරව විධිමත් ගිවිසුමකින් තොරව 2021 අයවැය ප්‍රතිපාදන යටතේ ඩොලමයිට් මෙ.ටොන් 13,000 ක් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් රු. මිලියන 101 කට මිලදී ගැනීමට එකඟ වී 2022 වර්ෂය අවසන් වන විට ඩොලමයිට් මෙ.ටො 533ක් පමණක් සපයා තිබුණු අතර ඒ සඳහා ඩොලමයිට් වටිනාකම රු.මිලියන 2ක් ද ප්‍රවාහන වියදම් රු.මිලියන 2 ක්ද වූ නමුත් එකඟ වූ ඩොලමයිට් ප්‍රමාණයෙන් සියයට 96 ක්ම සපයා නොතිබීම හේතුවෙන් හා සැපයුම් ප්‍රමාදවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබූ ඉතිරි රු.මිලියන 97 ක මුළු මුදලම "වෙනත් සහනාධාර ගෙවීම හා ආයතනික ප්‍රාග්ධන කටයුතු" සඳහා භාවිතා කිරීමට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 දෙසැම්බර් 21 දින තීරණය කර තිබුණි. මූලික වියදම් දරමින් හා විධිමත් | ඩොලමයිට් ඇණවුම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත දැනුම් දී ඇත. ඩොලමයිට් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය කාර්යාලය මගින් ඇණවුම් කර ඇත. එහෙත් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට මාස 08 ක කාලයක් තුල ඩොලමයිට් සැපයීමට හැකියාව ලැබුනේ ඩොලමයිට් මෙ.ටො. 533 ක් පමණි. ඩොලමයිට් මිලදී ගැනීම සඳහා ජාතික තරඟකාරී මිල ක්‍රමවේදය අනුගමනය කරන ලදී. මෙහිදී රාජ්‍ය ආයතනයක් වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව අතර අවශ්‍ය ඩොලමයිට් ප්‍රමාණය ගැනුම් ඇනවුමක් මගින් ගිවිසුම්ගත විය. ඩොලමයිට් මිලදී ගැනීමෙන් අනතුරුව ඉතිරි මුදල් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ කුඩා තේ වතු හිමියන්ගේ සහනාධාර වෙනුවෙන් ඇති කර ගත් බැදීම් නිදහස් කිරීමට පමණක් යොදවා ඇත. | ඩොලමයිට් මිලදී ගැනීමට ලද මුදලින් ඉතිරි වූ ප්‍රමාණය භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වෙනත් කාර්යයන් සඳහා වියදම් කිරීම සිදු නොකළ යුතුය. |

ගිවිසුම්ගතවීමකින් තොරව අධිකාරිය මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු බැවින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අරමුණු ඉටුකර ගත නොහැකි වීම තුලින් අසාර්ථක ව්‍යාපෘතියක් බවට එය පත්වී තිබුණි. එසේම "වෙනත් සහනාධාර ගෙවීම හා ආයතනික ප්‍රාග්ධන කටයුතු" සඳහා සිදුකළ වියදම් හඳුනා ගැනීමට තරම් ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ අනුමත කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි සංඛ්‍යාව 26 ක් වුවද තත්‍ය වශයෙන් නිලධාරීන් 14ක් පමණක් සේවයේ යෙදී සිටින බැවින් තේ ගොවීන් හා සමිති සමඟ රේඛීය සම්බන්ධතාවයක් පවත්වනු ලබන මෙම නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම තුළින් අධිකාරියේ සහනාධාර වැඩ පිළිවෙල සාර්ථකව ඉටුකිරීමට නොහැකි වී තිබුණි. | කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි පුරප්පාඩු පිරවීම සඳහා සේවක බඳවාගැනීම් සම්බන්ධයෙන් එක් එක් වකවානුවල පැවැති රජයේ සීමාකිරීම් ද ඉවහල් වී ඇති අතර කෙසේ වුවත් අධිකාරියේ කාර්යයන් ක්‍රියාත්මක කරගෙන යාම සඳහා වැඩබලන පදනමින් සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කොට අදාල පුරප්පාඩුවල රාජකාරින් නිසිපරිදි ක්‍රියාත්මක කරගනිමින් ආයතනික කටයුතු නිසි ඉලක්ක කරා මෙහෙයවා ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |